10 ශ්‍රේණිය

නිපුණතාව 2.0

## ස්වකීය පකරිල්පන මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණයෙහි යෙදෙයි.

### 2.5 පවරනු ලබන ක්ෂණික නිරූපණයන්හි යෙදෙයි.

ආයුබෝවන් දරුවනේ, දැන් හැමෝම රිහසල් කිට් දාගෙන ආවනේ. එහෙනම් මේ සීමාව ඇතුලෙ ඇවිදින්න. අනිත් අයගේ ඇඟේ ගැවෙන්න බෑ. කතා කරන්නත් බෑ. මම ඉලක්කමක් කියනවා එතකොට ඒ ඉලක්කමේ ඉන්න ගානට අත් අල්ලගෙන ඉඳගන්න ඕනේ. ඉතුරුවෙන අය අවුට් වෙනවා. හා හා දැන් යාලුවෝ හොයාගෙන යන්න එපා. හැම තැනම ඇවිදින්න. පහ. අයියෝ දඟලන්න දෙයක් නෑ. තිහයි ඉන්නේ ඔය කොහේද අරුණි දුවන්නේ. ඔය මේනකලගේ කණ්ඩායමෙන් ඉඳගන්න එතන හතරයි ඉන්නේ.

හොඳයි දැන් උක්කුටියෙන් ඉන්නෙ නැතුව හොඳට පොළොවේ ඉඳගන්න. හයේ ළමයි අද අතුගෑවා. ඕගොල්ලන්ට කවදද? ආ පෝය දවසනේ. හරි. දැන් මේ කියන දේවල් ටික හොඳට අහගන්න. අපි කලින් දවසක කළා, විවිධ තේමා යටතේ කණ්ඩායම් හා කේවල ඉදිරිපත් කිරීම්. ඒකෙදි මම කරන්න ඕන විදිය කිව්වෙ නෑ. ඔයාලට කැමති විදයට කළා. අපි සංවර්ධනය වෙන්න ඕන දේවල් කතා කළා. දැන් මම කණ්ඩායම් පහට තුණ්ඩු පහක් දානවා, අහඹුලෙස තෝරාගෙන සූදානම් වෙලා ඉදිරිපත් කිරීම කරන්න ඕනේ. ඒ තුණ්ඩුවේ ම තියෙනවා ඉදිරිපත් කරන පිළිවෙල. විනාඩි 4ක් දෙනවා සූදානම් වෙන්න. කණ්ඩයමකින් එක්කෙනෙක් ඇවිත් තුණ්ඩු ගන්න. කියන්න බලන්න ආපු මාතෘකා.

කවුද එක - ආ, පන්ති කාමරයට සර්පයෙකු පැමිණීම, දෙක - බස් රථයක සැක සහිත පාර්සලයක් හමු වීම, තුන - කොරෝනා යැයි සැක සහිත රෝගියෙකු පාසලට පැමිණීම, හතර - පාසලේ අඹ ගසකට ගල් ගසා අංශ ප්‍රධාන ගුරුවරයාට හසුවීම, පහ - චාරිකාවකට සහභාගි වී සිටියදී යම් අනතුරකට ලක් වීම.

සිසුන් ඉදිරිපත් කිරීම් කළ පසු ඒ එක් එක් ඉදිරිපත් කිරීම් පිළිබඳ කතා කිරීම, සංවර්ධනය විය යුතු තැන්, හොඳින් කෙරුණු තැන් ආදිය පිළිබඳව. සමහර ඉදිරිපත් කිරීම්වල නාට්‍යෝචිත අවස්ථාවක් මතු වුණේ නෑ. බලං හිටපු අයට තේරෙන්න ඇති, කුතුහලයක් තිබුණෙ නෑ. තව එකක දෙකක ආරම්භය හොඳට තිබුණා, අන්තිම වෙද්දි ඉවරකර ගන්න විදිය ගැන හිතල තිබුණෙ නෑ. සමහරු මොකක් හරි පටං ගත්තා මැද්දෙදි වැඩේ අහු වුණා, අවසානය ඉතා හොඳ තැනකට ආවා. කණ්ඩායම් හැම එකේම වගේ හිටියා හොඳට වැඩේට සපෝට් කරපු අය වගේම මගේ නෙවෙයි, මට නෙවෙයි වගේ ඔහේ හිටපු අයත්. ඒ වගේ නිර්මාණ එතරම් සාර්ථක වුණේ නෑ. අනික තමයි, එතනදි තමන්ට ලැබෙන චරිතය මතු වෙලා පේන්න රඟපාන්න ඕනේ. හැමෝම ඔයාල දැකපු, අහපු දේවල් එක්ක තමන්ට ලැබුණු චරිතයට දේවල් එකතු කර ගන්න ඕනේ, දැන් බලන්න උදාරිට අපි කියල නෙවෙයිනේ, එයාගෙ කතාව අතරට එයා 'හොඳේ' කියල එකක් දැම්මා. නාමල් ඒ වැඩේ පුරාම නොන්ඩි ගැහුවා. ඒවට අපි කියනවා චරිත ලක්ෂණ කියලා. ඉතාම හොඳයි.

දැන් අපි බලමු මේ වගේ ලැබෙන මාතෘකාවකට අදාළව තනියම ඉදිරිපත් කිරීමක් කොහොමද කරන්නෙ කියලා. අපි කලින් දවසේ හැමෝටම අවස්ථාව දුන්නනේ. අද වෙලාව අනුව ඉස්සරලා ම ඉදිරිපත් වෙන හතර දෙනාට හරි පස් දෙනාට හරි අවස්ථාව ලැබෙනවා. මෙතන තුණ්ඩු කීපයක් තියෙනවා. ඇවිත් ඒකෙන් එකක් අරගෙන පොඩි වෙලාවක් හිතල ඉදිරිපත් කිරීම කරන්න.

(ළමුන් ඉදිරිපත් කිරීම් සිදු කරයි.)

හොඳයි, ඔයාලට තේරුණා නේද එදා අපි කරපු ඒවට වඩා යම් සංවර්ධනයක් අද ඉදිරිපත් කිරීම්වල තිබුණා කියලා. එදා මම කිව්ව කරුණු අරුණි හොඳට මතක තියාගෙන තියෙනවා. අපි කරන්නෙ එක චරිතයක් තමයි, හැබැයි අපි රඟපාද්දි අපි ඉදිරියේ ඉන්න චරිතත් බලන අයට මැවෙන්න ඕනේ. දෙන මාතෘකාවට මුල අග නිර්මාණය කර ගැනීම, නාට්‍යෝචිත අවස්ථාවක්, හොඳ ප්‍රභල අවසානයක් තියෙන්න ඕනේ, ඒ වගේ ම ලැබුණු චරිතය හොඳට මතු වෙන්න ඕනේ. අවස්ථාව මතු වෙන්න ඕනේ මේ කරුණු සම්පූර්ණ නම් හොඳ ඉදිරිපත් කිරීමක් කියල අපිට කියන්න පුළුවන්.

මේ ක්ෂණික නිරූපණවලින් මොනවද වෙන්නේ,

ඔව්, සාමාන්‍යපෙළ විභාගේ ප්‍රායෝගි පරීක්ෂණයෙදි එන නිසා සූදානම් වෙන්න පුළුවන්. තව ඒක හින්දම ද අපි වෙම් කරන්නේ, ඔව් සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව වැඩි වෙනවා, ක්ෂණිකව රංගනයේ යෙදෙන්න පුළුවන් වෙනවා, තව පරිකල්පනය දියුණු වෙනවා. අභිනය ප්‍රදර්ශනය කිරීමේ හැකියාව වැඩි වෙනවා. නිර්මාණාත්මකව සිදුවීම් ගොඩනැගීමට හැකි වෙනවා. හරි.

දැන් ගෙදරදී මෙන්න මේ වැඩේ කරන්න ඕනේ. පොතේ ලියාගන්න.

ක්ෂණික නිරූපණයකින් රංගන ශිල්පීන්ට ලබා ගත හැකි ප්‍රයෝජන ලැයිස්තුවක් සකස් කරන්න.